# මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි (PL1 -2016 ) දෙපාර්තමේන්තු කම්කරු තනතුර සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටිය

1. සම්බන්ධ වන ආයතන

   1.1 දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

   යොමු අංකය - CPC / PDA / 1/7/2 දිනය : 2023.03.23

   1.2 අමාත්‍යාංශය - මධ්‍යම පළාත් කෘෂිකර්ම , සුළු වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය

   යොමු අංකය - CPC/MA/1/6/4/10 දිනය: 2023.03.28

   1.3 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

   යොමු අංකය - CPC/CS/01/ 04/15/05 දිනය : 2023.07.06

   1.4 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

   යොමු අංකය - CPC/PSC/29/2/2 දිනය : 2023.08.22

   1.5 මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

   යොමු අංකය - දිනය :

2. ක්‍රියාත්මක වන දිනය - 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වගන්තිය අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි (PL1-2016) දෙපාර්තමේන්තු කම්කරු වාර්ෂික ස්ථාන මාරු සඳහා වූ මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද දිනයේ සිට ක්‍රියාත්මක වේ.

3. මෙම ස්ථානමාරු ක්‍රියාත්මක කරනු ලබන්නේ ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ III වන පරිච්ඡේදයේ කරුණු වලට අදාලවය. මෙම ස්ථානමාරු පරිපාටිය මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි (PL1-2016) දෙපාර්තමේන්තු කම්කරු නිලධාරින් වාර්ෂිකව අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය වේ.

4. මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාළ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් විසින් වාර්ෂිකව ස්ථාන මාරු ඉල්ලුම්පත් සහ අදාළ අනෙකුත් විස්තර සලකා බලා මාරු මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත අදාළ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ විසින් ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කරනු ලැබේ.

5. වාර්ෂික ස්ථාන මාරු වලින් පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදි පහත දැක්වෙන හේතු මත ස්ථාන මාරුවීමක් කළයුතු යැයි පළාත් අධ්‍යක්ෂ විසින් අදහස් කරනු ලබන විට ඒ සඳහා ඔහුට / ඇයට බලය පැවරේ. එවැනි ස්ථාන මාරු වීමකින් අතෘප්තියට පත්වන නිලධාරින්ට පළාත් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හැකිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-09-04 දින
අනුමත කරන ලදී.



ආණ්ඩුකාර ලේකම්

5.1 සේවා අවශ්‍යතාවය මත සිදුකරනු ලබන ස්ථාන මාරු
5.2 අන්‍යෝන්‍යය ඉල්ලීම් මත කරනු ලබන ස්ථාන මාරු
5.3 විධිමත් ලෙස පත් කළ රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත කරනු ලබන ස්ථාන මාරු
5.4 සේවා ස්ථානයේ වෙනසක් සිදු නොවන පරිදි සිදුකරනු ලබන අභ්‍යන්තර ස්ථාන මාරු
5.5 විනය නියෝගයන් මත හෝ විනයානුකූල ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවය මත හෝ කරනු ලබන ස්ථාන මාරු

6. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම්

6.1 අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය ක්‍රියාත්මක කෙරේ.

6.2 මාරු මණ්ඩලය ස්ථාපනය කිරීම
මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් මධ්‍යම පළාත් ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි (PL1-2016) දෙපාර්තමේන්තු කම්කරු නිලධාරින්ගේ ස්ථාන මාරු මණ්ඩලය වාර්ෂිකව ස්ථාපනය කෙරේ.

6.3 එක් සේවා ස්ථානයක මෙම පරිපාටියේ 9.1 කොන්දේසිය අනුව නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට අදාළ සේවයේ තමන් කැමති (හයවන පරිශිෂ්ඨය යටතේ අනුමත වී ඇති ) වෙනත් සේවා ස්ථානයනට ස්ථාන මාරු වීමක් ලබා ගැනීමට අයදුම් කල යුතුය.

6.4 එවැනි ඉල්ලුම්පත් පළමුවන පරිශිෂ්ඨය පරිදි සකස් කර සිය ආයතන ප්‍රධානීන් මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

6.5 ස්ථාන මාරු වීම් වලදී සලකා බලනු ලබන පොදු කොන්දේසි පහත පරිදි වේ.

6.5.1 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ පවත්නා වසරේ දෙසැම්බර් 31 දිනටය.

6.5.2 සේවා කාලය ගණනය කිරීමේදී සේවා ස්ථානයක අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාල වල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

6.5.3 යම් නිලධාරියෙකු ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක කාලයක් සම්පූර්ණ කර ඇත්නම් , ප්‍රියමනාප නොවන හා දුෂ්කර සේවා ස්ථානයක සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරින්ට ස්ථාන මාරුවීම් ලබා දිය හැකි වන පරිදි ඔහුගේ / ඇයගේ කැමැත්ත නොමැතිව වුවද ස්ථාන මාරුවක් ලැබීමට යටත් වනු ඇත.

6.5.4 නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති විට වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අයදුම් කිරීම නිලධාරියාගේ වගකීම වන අතර, එසේ නියමිත සේවා කාලය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 04 - 04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

සම්පූර්ණ කර ඇතත්, අයදුම් නොකරන නිලධාරින් ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමති ලෙස සලකා ස්ථානමාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇති වන ඕනෑම සේවා ස්ථානයකට ස්ථාන මාරු කරනු ලැබේ.

6.5.5 දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපල් වල පුරප්පාඩු පිරවීමට ප්‍රමුඛත්වය ලබා දීමෙන් අනතුරුව අනෙකුත් කාර්යාල වල පුරප්පාඩු පිරවිය යුතුය.

6.5.6 ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය , ස්ථාන මාරුව ක්‍රියාත්මක වන වසරේ ජනවාරි 01 දින වේ.

6.5.7 මාරුවීම් අපේක්ෂා නොකරන ඉතා ප්‍රියමනාප හා ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් තමා ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද ස්ථාන මාරු කළ හොත් යාමට අපේක්ෂිත සේවා ස්ථානය සඳහන් කර තෙවන පරිශිෂ්ඨය අනුව තොරතුරු තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් කැඳවන පළාත් අධ්‍යක්ෂ වෙත නියමිත දිනට පෙර අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතුය.

6.5.8.

1. ඉහත 6.4 ඡේදයේ සඳහන් පළමුවන පරිශිෂ්ඨය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ හා ඉදිරිපත් නොකළ වසර 05කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරින් පිළිබඳ තොරතුරු සිව්වන පරිශිෂ්ඨයට අනුව නිවැරදිව සම්පූරණ කර දිස්ත්‍රික් භාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත සෑම වසරකම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සමඟ නියමිත දිනට පෙර ඉදිරිපත් කල යුතුය.

2. අනුමත නිවාඩු , වැටුප් ( සහිත / රහිත ) නිවාඩු ලබා සිටින නිලධාරින් නිවාඩු කාලය අනුමත කරන අවස්ථාවේ සේවය කල ආයතනය අදාළ සේවා ස්ථානය ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

3. අනුමත වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාල සීමාවක් ඇත්නම් එම කාලය වැටුප් රහිත නිවාඩු අනුමත කරන අවස්ථාවේ සේවය කළ සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු නොලැබේ.

4. අනුයුක්තයකදී එම කාලය අනුයුක්ත කළ කාර්යාලය පදනම් කර ගෙන සේවා ස්ථාන වර්ගීකරණය සලකා බලා ලකුණු ගණනය කළ යුතුය.

6.5.9 සේවා ස්ථානයක පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය. දුෂ්කර සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ කර තිබුණ ද ස්ථානමාරු වීමක් ඉල්ලීමට අපේක්ෂා නොකරන්නේ නම් හා එම සේවා ස්ථානය සඳහා වෙනත් නිලධාරියෙකු අයදුම් කර නොමැති අවස්ථාවක දී අදාල නිලධාරියා එම සේවා ස්ථානයේ තවදුරටත් සේවයේ යෙදවීම පිළිබඳ සලකා බැලිය හැක.

7. සේවා ස්ථාන අතර, වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේ දී අනුමත ස්ථාන මාරු පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ මත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කල යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-09-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

8. සේවා ස්ථාන වර්ගීකරණය

8.1 මධ්‍යම පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යාල, දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපලවල් හා කෘෂිකර්ම උපදේශක කොට්ඨාශ වල භූගෝලීය පිහිටීම හා ඒ මත නිර්මාණය වී ඇති පහසුකම් හා දුෂ්කරතා , මානව, භෞතික සම්පත් සහ නිලධාරින්ගේ ඉල්ලුම පදනම් කරගනිමින් වාර්ෂිකව සමාලෝචනය කිරීමට යටත්ව , පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ. (සේවා ස්ථාන වර්ගීකරණය දෙවන පරිශිෂ්ඨයෙහි දැක්වේ. )

A වර්ගය - ඉතා ප්‍රියමනාප

B වර්ගය - ප්‍රියමනාප

C වර්ගය - ප්‍රියමනාප නොවන

D වර්ගය - දුෂ්කර

9. ස්ථාන මාරුවක් ලබා දීමේදී සැලකිල්ලට ගනු ලබන කරුණු

9.1 ස්ථාන මාරුවක් ඉල්ලීමේ දී සපුරාලිය යුතු අවම සේවා කාලය

9.1.1. දුෂ්කර සේවා ස්ථානයක ( D) අවම වසර 2ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කල හැකි වේ.

9.1.2 ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක ( C) අවම වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කල හැකි වේ.

9.1.3 ප්‍රියමනාප සේවා ස්ථානයක ( B) අවම වසර 4ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කල හැකි වේ.

9.1.4 ඕනෑම සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයෙන් යටත් විය යුතුය.

9.2 ස්ථාන මාරු වීමක් ලබා ගැනීම සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය

9.2.1 සේවය කරන සේවා ස්ථානය පදනම් කර ගනිමින් නිලධාරියෙකුට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 70 කි.

9.2.2 ඉහත 8.1 හි දැක්වෙන සේවා ස්ථාන වර්ගීකරණය අනුව ඒ ඒ සේවා ස්ථාන වල සේවය කර ඇති කාල සීමාව සැළකිල්ලට ගෙන නිලධාරින්ට පහත දැක්වෙන පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

සේවා ස්ථානය අනුව

A වර්ගය - ඉතා ප්‍රියමනාප - පූර්ණ වර්ෂයකට ලකුණු 01 යි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

B වර්ගය - ප්‍රියමනාප - පූර්ණ වර්ෂයකට ලකුණු 02 යි.

C වර්ගය - ප්‍රියමනාප නොවන - පූර්ණ වර්ෂයකට ලකුණු 03 යි.

D වර්ගය - දුෂ්කර - පූර්ණ වර්ෂයකට ලකුණු 04 යි.

වසරකට අඩු එහෙත් මාස 06ක් හෝ ඊට වැඩි සේවා කාලයක් යම් සේවා ස්ථානයක සේවය කර ඇත්නම් ඔහුට / ඇයට අදාල සේවා ස්ථානයට හිමි ලකුණු ප්‍රමාණයෙන් 50%ක් හිමි වේ.

9.2.3 නිලධාරියාගේ සේවා කාලය සලකා ඉහත පරිදි ලකුණු ලබා දීමට අමතරව ස්ථාන මාරු ලබා දීමේදී ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් කරුණු ද අනුව ඇගයීමකට ලක් කර ලකුණු ලබා දීමක් සිදු කෙරේ.

| | | ලකුණු |
|---|---|---|
| 1. | නිලධාරියාගේ ස්ථිර පදිංචිය - | 05 |
| 2. | කලත්‍රයාගේ රැකියා ස්ථානය - | 05 |
| 3. | පාසල් යන දරුවන් සිටීම - | 05 |
| 4. | මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැලකිල්ලට ගත් විශේෂ කරුණු - | 05 |
| 5. | නිලධාරියාගේ වාර්ෂික කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීම - | 10 |
| | ( ආසන්න වසර 03ක උපරිම) | 30 |

අදාල නිලධාරියාගේ කාර්ය සාධන තීරණ ඇතුළත් සංක්ෂිප්ත වාර්තාවක් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ස්ථාන මාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

10. ඉහත සඳහන් කරුණු යටතේ ස්ථාන මාරු අයදුම් කරන සියළු නිලධාරින් පළමුවන පරිශිෂ්ඨයෙහි සඳහන් ආකෘති පත්‍රය පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියමිත දිනට පෙරාතුව ඉදිරිපත් කළ යුතුය.

11. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම

11.1 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වේ.

I. විෂය භාර අමාත්‍යාංශයේ නියෝජ්‍ය ප්‍රධානියෙක් හෝ සහකාර ප්‍රධානියෙකු
II. මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාළ කටයුතු භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු
III. අදාල සේවයට අයත් වෘත්තීය සමිතිය විසින් නම් කළ නියෝජිතයෙකු ( අදාළ නියෝජිතයා ස්ථාන මාරු ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොමැති අයෙකු විය යුතුය )

11.2 ස්ථාන මාරු මණ්ඩලය වෙත ලැබී ඇති ඉල්ලුම්පත් හා අනෙකුත් විස්තර සැලකිල්ලට ගෙන සිය යෝජනා පළාත් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම යෝජනා සම්බන්ධ තම නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වරයා වෙත පළාත් අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කල යුතුය. පළාත් අධ්‍යක්ෂ විසින් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ එකඟතාවය මත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කරනු ලැබේ

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-09-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

11.3 එම යෝජිත වාර්ෂික ස්ථාන මාරු වලින් අතෘප්තියට පත් වන නිලධාරීන් සිය අභියාචනා පස්වන පරිශිෂ්ඨයෙහි සඳහන් අකෘතිපත්‍රය අනුව සකසා තම ආයතන ප්‍රධානියා මගින් පළාත් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එලෙස වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ පළමුවන පරිශිෂ්ඨය හෝ තෙවන පරිශිෂ්ඨය මගින් ඉල්ලීම් ඉදිරිපත් කල නිලධාරීන් හට පමණි.

11.4 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා කමිටුව පහත සඳහන් නිලධාරීන් ගෙන් සමන්විත විය යුතුය.

1. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාළ වර්ෂයේ මෙම වාර්ෂික ස්ථානමාරු මණ්ඩලයේ සේවය නොකල මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු

2. විෂයභාර අමාත්‍යාංශයේ අදාළ වර්ෂයේ මෙම වාර්ෂික ස්ථානමාරු මණ්ඩලයේ සේවය නොකල ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු
( ඔවුන් අතරින් වඩාත් ජ්‍යෙෂ්ඨ නිලධාරියා සභාපති වශයෙන් පත් කල යුතුය.)

11.5 සෑම වසරකම ඔක්තෝම්බර් මස 31 දිනට ප්‍රථම අභියාචනා කමිටුව විසින් ඉදිරිපත් වන අභියාචනා සලකා බලා සිය නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ සඳහා පදනම් වූ හේතු ද එම වාර්තාවෙහි අඩංගු විය යුතුය.

11.6 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය හා ස්ථාන මාරු අභියාචනා කමිටුවේ නිර්දේශයද සලකා බලා වාර්ෂික ස්ථාන මාරු නියෝග පළාත් අධ්‍යක්ෂවරයා විසින් නොවැම්බර් මස 15 දිනට පෙර නිකුත් කරනු ලැබේ.

11.7 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබන සියළු නිලධාරීන් 6.5.6 වගන්තිය අනුව නියමිත දිනට එම නියෝග පරිදි නියමිත බලධාරීන් වෙත රාජකාරියට වාර්තා කළ යුතුය.

11.8 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා කමිටුව විසින් ලබාදෙන අවසන් තීරණයට එකඟ නොවන අවස්ථාවක් සම්බන්ධයෙන් තීරණ ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරයාට පූර්ණ හා අවසාන බලය පැවරේ.

12. වයස අවු 58ට වැඩි නිලධාරියෙකු එකී නිලධාරියාගේ කැමැත්තක් නොමැතිව මෙම පරිපාටිය අනුව ස්ථාන මාරු වීම් වලට භාජනය නොවනු ඇත.

13.ස්ථාන මාරු වීම් පහත කාල සටහන අනුව ක්‍රියාත්මක වන අතර මෙම කාල පරාසයට අනුකූලව දිනවකවානු වෙනස් කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම් සතු වේ.

| | |
|---|---|
| 13.1 ස්ථාන මාරු වීම් ඉල්ලීම් භාර ගන්නා අවසාන දිනය | - අගෝස්තු 15 දිනට පෙර |
| 13.2 ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | - ඔක්තෝම්බර් 01 දිනට පෙර |
| 13.3 ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කල යුතු අවසන් දිනය | - ඔක්තොම්බර් 31 දිනට පෙර |
| 13.4 අභියාචනා තීරණ මත අවසාන ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | - නොවැම්බර් 15 දිනට පෙර |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-07-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

14. පාලනය

14.1 මෙම වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ක්‍රියා කරනු ලැබේ.

15. මෙම පරිපාටියේ පිළිවෙළින් " ලේකම් " යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ. " පළාත් අධ්‍යක්ෂ " යනුවෙන් අදහස් කරන්නේ මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

පළමුවන පරිශිෂ්ඨය

(පරිපාටිය 9.1 යටතේ සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතු ය.)

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ශ්‍රේණියෙහි **(PL1 -2016 )** කම්කරු තනතුර සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථානමාරු අයදුම්පත්‍රය

01. නිලධාරියාගේ සම්පූර්ණ නම :- ..........................................................................................

........................................................................................................................ මයා/මිය/ මෙනවිය.

02. ලිපිනය

2.1 ස්ථිර පෞද්ගලික :- ......................................................................

2.1.1 දිස්ත්‍රික්කය :- ......................................................................

2.1.2 ප්‍රා.ලේ.කොට්ඨාශය :- ......................................................................

2.2 දැනට සේවය කරන සේවා ස්ථානය :- ......................................................................

2.2.1 දිස්ත්‍රික්කය :- ......................................................................

2.2.2 ප්‍රා.ලේ.කොට්ඨාශය :- ......................................................................

03. උපන් දිනය :- ......................................................................

3.1 20...... දෙසැ. 31 දිනට වයස :- අවුරුදු ............. මාස ................. දින .......... ......

04. ජාතික හැඳුනුම්පත් අංකය :- ......................................................................

05. ස්ත්‍රී / පුරුෂ භාවය :- ..........................................

06. විවාහක / අවිවාහක තත්ත්වය : - ......................................................................
විවාහක නම්

6.1 කලත්‍රයා පිළිබඳ විස්තර

6.1.1 කලත්‍රයාගේ නම :- ......................................................................

6.1.2 කලත්‍රයාගේ සේවා ස්ථානය :- ......................................................................

6.1.2.1 දිස්ත්‍රික්කය :- ......................................................................

6.1.2.2 ප්‍රා.ලේ.කොට්ඨාශය :- ......................................................................

6.1.3 කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතු ද :- ......................

6.1.4 එසේ නම් ඔහු / ඇය අයත් වන සේවාව හා තනතුර :- ......................................................

6.2 දරුවන් පිළිබඳ විස්තර

| දරුවාගේ නම | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 07 - 04 ..... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

07. දුරකථන අංක :- නිවස:- ......................................   ජංගම:- ..............................................

08. සේවයට ඇතුළත් වූ දින සිට මෙ දක්වා එක් එක් සේවා ස්ථානවල සේවය කර ඇති සේවා විස්තර :-

( මෙම ආකෘතිය සම්පූර්ණ කිරිමේදි සේවා ස්ථානය පිළිබඳ විස්තර ඉතා වැදගත් බැවින් මෙම ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අනුරූප වෙනත් ඇමුණුමක් ඇතුළත් කරන්න. අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතු ය. )

| සේවා ස්ථානය | දිස්ත්‍රික්කය | සේවා ස්ථාන වර්ගීකරණය අනුව අදාල වන වර්ගය ( A,B,C,D - දෙවන පරිශිෂ්ඨය අනුව ) | කාල සීමාව | | මුළු සේවා කාලය | සේවය කරන ලද සේවා ස්ථානය අනුව තමන් විසින් අපේක්ෂා කරනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | | |
| | | | | | | |

09. ස්ථාන මාරුව ඉල්ලා සිටින සේවා ස්ථාන 03ක් ( කැමැත්ත අනුව පිළිවෙලින් ) :-

දිස්ත්‍රික්කය   සේවා ස්ථානය

9.1 ..................................................

..................................................................................

9.2 ..................................................

..................................................................................

9.3 ..................................................

..................................................................................

10. විශේෂයෙන් සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම්:-

..................................................................................

..................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

තවද ස්ථාන මාරු පරිපාටියේ 6.5.5 වගන්තියට අනුව ගොවිපල් වල පුරප්පාඩු සඳහා ප්‍රමුඛත්වය දී ස්ථාන මාරු සලකා බලන බව ද මා දනිමි.

දිනය :- ....................................... .   ..............................................................

නිලධාරියාගේ අත්සන

## II කොටස

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නිර්දේශය

ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

දිනය :- ................................... .

....................................................................

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(නිල මුද්‍රාව)

III කොටස (පරිපාටියේ 6.5.8 හා බැදේ)

දුෂ්කර සේවා ස්ථානයක තවදුරටත් සේවය කිරීමට එකඟතාවය

දුෂ්කර සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වුවත් තවදුරටත් එම සේවා ස්ථානයේ සේවය කිරීමට එකඟ බව ප්‍රකාශ කරමි.

දිනය :- ......................................                ..........................................

නිලධාරියාගේ අත්සන

දුෂ්කර සේවා ස්ථානයක වසර 05ක සේවා කාලය සම්පූර්ණ වුව ද තවදුරටත් එම සේවා ස්ථානයේ සේවයේ යෙදවීම සුදුසු බව නිර්දේශ කරමි/ නොකරමි.

දිනය :- .......................................

............................................................

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
( නිල මුද්‍රාව)

---

IV කොටස

ස්ථානමාරු මණ්ඩලයේ යෝජනා :-

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................

සාමාජිකයින්ගේ

| | නම | තනතුර | අත්සන | දිනය |
|---|---|---|---|---|
| 01. | ............................................................ | .................................... | ........................ | .................. |
| 02. | ............................................................ | .................................... | ........................ | .................. |
| 03. | ............................................................ | .................................... | ........................ | .................. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

## සේවා ස්ථාන වර්ගීකරණය

| දිස්ත්‍රික්කය | ඉතා ප්‍රියමනාප ( A වර්ගය) | ප්‍රියමනාප ( B වර්ගය) | ප්‍රියමනාප නොවන ( C වර්ගය) | දුෂ්කර ( D වර්ගය) |
|---|---|---|---|---|
| මධ්‍යම පළාත | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | --- | --- | --- |
| මහනුවර | 1. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මහනුවර<br>2. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - කුණ්ඩසාලේ කලාපය<br>3. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මහනුවර කලාපය<br>4. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - උඩුනුවර - යටිනුවර කලාපය<br>5. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - හාරිස්පත්තුව කලාපය<br>6. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - තෙල්දෙණිය<br>7. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - නමදගල<br>8. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - වාවින්න<br>9. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - දිගන<br>10. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- මැණික්හින්න<br>11. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- ගුන්නෑපාන<br>12. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- කැටවල ලෙව්ල<br>13. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- බෝවල<br>14. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- වත්තේගම | 1. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මාරස්සන<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - අඹන්වල<br>3.කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කුරුදුවත්ත | 1. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - දඹගහපිටිය<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - නුගේතැන්න<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මැදමහනුවර<br>4. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කළුන්තැන්න<br>5. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - උඩිස්පත්තුව<br>6. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - වේඩරුව<br>7. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගලහ<br>8. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මුල්ගම<br>9. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - අංකුඹුර<br>10. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - අළුදෙණිය | 1. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපල - නවයාලතැන්න<br>2.කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය - පල්ලේකැලේ<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - උල්පතගම<br>4. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මොරයාය<br>5.කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හුළුගහ |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 -09 -04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| දිස්ත්‍රික්කය | ඉතා ප්‍රියමනාප ( A වර්ගය) | ප්‍රියමනාප ( B වර්ගය) | ප්‍රියමනාප නොවන ( C වර්ගය) | දුෂ්කර ( D වර්ගය) |
|---|---|---|---|---|
| | 15. කෘෂිකර්ම උපදේශක කාර්යලය - තලාතුඔය<br>16. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- ඒ දඩුවාව<br>17. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- ගිරාගම<br>18. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- මැණික්දිවෙල<br>19. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- ඉඹුල්දෙණිය<br>20. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- තලවතුර<br>21. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- පෙතියාගොඩ<br>22. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- අලපලාවල<br>23. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- ගම්පල<br>24. කෘෂිකර්ම උපදේශක කාර්යාලය -දැල්පිටිය<br>25. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- මැදපිටිය<br>26. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- යටිවාවල<br>27. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- මැදවල<br>28. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- හතරලියද්ද<br>29. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- වැලිවිට<br>30. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- බටුගොඩ<br>31. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- වැවල<br>32. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- ගලගෙදර<br><br>ඉතා ප්‍රියමනාප (A වර්ගය ) | | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| දිස්ත්‍රික්කය | | ප්‍රියමනාප ( B වර්ගය) | ප්‍රියමනාප නොවන ( C වර්ගය) | දුෂ්කර ( D වර්ගය) |
|---|---|---|---|---|
| | 33. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- අලවතුගොඩ<br>34. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- රඹුක්පිටිය | | | |
| මාතලේ | 1. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මාතලේ<br>2. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මාතලේ කලාපය<br>3. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - දඹුල්ල කලාපය<br>4. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - ලග්ගල කලාපය<br>5. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - රත්තොට<br>6. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- බණ්ඩාරපොළ<br>7. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - වේරගම<br>8. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- උකුවෙල<br>9. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- තැන්න<br>10. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- යටවත්ත<br>11. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- පලාපත්වල<br>12. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- දඹුල්ල<br>13. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- ගලේවෙල<br>14. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- වාසලකෝට්ටේ<br>15. කෘෂිකර්ම උපදේශක කාර්යාලය- පල්ලේපොල | 1. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ඇල්කඩුව<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - වාලවෙල<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කිඹිස්ස<br>4. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හත්තොටඅමුණ | 1. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මකුළුගස්වැව<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හුණුකැටඇළ<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හෙට්ටිපොළ | 1. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපල - නාලන්ද<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ඉලුක්කුඹුර<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හඳුන්ගමුව |
| දිස්ත්‍රික්කය | ඉතා ප්‍රියමනාප ( A වර්ගය) | ප්‍රියමනාප ( B වර්ගය) | ප්‍රියමනාප නොවන ( C වර්ගය) | දුෂ්කර ( D වර්ගය) |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-09-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| | | | | |
|---|---|---|---|---|
| | 16. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-අළුගොල්ල<br>17. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-කෝන්ගහවෙල<br>18. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-ලග්ගල | | | |
| නුවරඑළිය | 1. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - නුවරඑළිය<br>2. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - නුවරඑළිය කලාපය<br>3. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - කොත්මලේ අඹගමුව කලාපය<br>4. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - හඟුරන්කෙත කලාපය<br>5. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - වලපනේ කලාපය<br>6. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-නුවරඑළිය<br>7. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-කඳපොළ<br>8. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හෙල්බොඩ<br>9. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-හඟුරන්කෙත<br>10. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-රිකිල්ලගස්කඩ<br>11. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-වලපනේ<br>12. කෘෂිකර්ම උපදේශක කාර්යාලය-රාගල | 1. කෘෂිකර්ම උපදේශක කාර්යාලය -හරංගල<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මල්දෙණිය<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගිනිගත්හේන<br>4. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කරල්ලියද්ද<br>5. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - බුළුගහපිටිය<br>6. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මුංවත්ත<br>7. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - නිල්දණ්ඩාහින්න | 1. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ලිඳුල<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - පූඩළුඔය<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - පල්ලේබෝවල<br>4. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මතුරට<br>5. කෘෂිකර්ම උපදේශක කාර්යාල - මන්දාරම්නුවර | 1. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපල - ගල්පාලම<br>2. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - විදුලිපුර<br>3. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - තෙරිපැහැ<br>4. කෘෂිකර්ම උපදේශක කාර්යාලය - රූපහ |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-09-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

තෙවන පරිශිෂ්ඨය

(පරිපාටියේ 6.5.7 හා බැඳේ.)

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි ( PL1 -2016) කම්කරු තනතුර සඳහා වන වාර්ෂික ස්ථානමාරු පරිපාටියේ 6.5.7 වගන්තිය අනුව නිලධාරීන් විසින් සම්පූර්ණ කළයුතු අයදුම්පත්‍රය

01. නිලධාරියාගේ සම්පූර්ණ නම :- ................................................................................................

.................................................................................................................................... මයා/මිය/ මෙනවිය

02.ලිපිනය

2.1 ස්ථිර පෞද්ගලික :- ................................................................................................

2.1.1 දිස්ත්‍රික්කය :- ................................................................................................

2.1.2 ප්‍රා.ලේ.කොට්ඨාශය :- ................................................................................................

2.2 දැනට සේවය කරන සේවා ස්ථානය:- ................................................................................................

2.2.1 දිස්ත්‍රික්කය :- ................................................................................................

2.2.2 ප්‍රා.ලේ.කොට්ඨාශය :- ................................................................................................

03.උපන් දිනය :- ................................................................................................

3.1 20...... දෙසැ. 31 දිනට වයස :- අවුරුදු .................... මාස .................... දින ....................

04. ජාතික හැඳුනුම්පත් අංකය :- ................................................................................................

05. ස්ත්‍රී / පුරුෂ භාවය :-......................................

06.විවාහක / අවිවාහක තත්ත්වය : - ................................................................................................

විවාහක නම්

6.1 කලත්‍රයා පිළිබඳ විස්තර

6.1.1 කලත්‍රයාගේ නම :- ................................................................................................

6.1.2 කලත්‍රයාගේ සේවා ස්ථානය:- ................................................................................................

6.1.2.1 දිස්ත්‍රික්කය :- ................................................................................................

6.1.2.2 ප්‍රා.ලේ.කොට්ඨාශය :- ................................................................................................

6.1.3 කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතු ද:- ..................................

6.1.4 එසේ නම් ඔහු / ඇය අයත් වන සේවාව හා තනතුර:- ................................................................................................

6.2 දරුවන් පිළිබඳ විස්තර

| දරුවාගේ නම | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

07. දුරකථන අංක :- නිවස:- ........................................ ජංගම:- ........................................

@ - 15

ආණ්ඩුකාර ලේකම්

08. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- .................................... ....................................

09. වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර නොමැති බැවින් ස්ථාන මාරුවක් ලබා දුනහොත් සේවය කිරීමට කැමති සේවා ස්ථාන 03 ( කැමැත්ත අනුව පිළිවෙලින් )

| | දිස්ත්‍රික්කය | සේවා ස්ථානය |
|---|---|---|
| 9.1 | .......................................... | .................................................................... |
| 9.2 | .......................................... | .................................................................... |
| 9.3 | .......................................... | .................................................................... |

10. විශේෂයෙන් සඳහන් කිරීමට ඇති හේතු ඇත්නම් : -

..............................................................................................................................................................

..............................................................................................................................................................

.................................

..............................................................................................................................................................

..............................................................................................................................................................

..............................................................................................................................................................

..............................................................................................................................................................

..................................................................

දිනය :- ....................................

..............................................

නිලධාරියාගේ අත්සන

II කොටස

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නිර්දේශය :-

අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය:- .................................... .

..............................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
( නිල මුද්‍රාව)

III කොටස

ස්ථානමාරු මණ්ඩලයේ යෝජනා :-

..............................................................................................................................................................

..............................................................................................................................................................

..............................................................................................................................................................

සාමාජිකයින්ගේ

| | නම | තනතුර | අත්සන | දිනය |
|---|---|---|---|---|
| 01 | ............................................................ | .................................. | ........................... | .................... |
| 02 | ............................................................ | .................................. | ........................... | .................... |
| 03 | ............................................................ | .................................. | ........................... | .................... |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-07-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

එක් සේවා ස්ථානයක අවුරුදු 05ට වැඩි කාලයක් සේවය කර ඇති මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි ( PL1 -2016) කම්කරු සියළුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යෙන් ඇතුළත් විය යුතු බව සලකන්න.

එකම සේවා ස්ථානයක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න. (සේවා කාලය ගණන් කළ යුත්තේ පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය)

දිස්ත්‍රික්කය - .................................

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|
| අ.අ. | නිලධාරියාගේ නම (මයා/මිය/මෙනවිය ) | උපන් දිනය | 20.....දෙසැම්බර් 31 දිනට වයස | වර්තමාන සේවාස්ථානය හා එහි සේවා කාලය දෙසැම්බර් 31ට | ශ්‍රේණිය | ස්ථිර පදිංචි ලිපිනය | වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම් කර තිබේ ද? | වර්තමාන සේවාස්ථානයේ වසර 05ට වඩා සේවය කර ඇත්නම් ඊට හේතුව |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |
| 6 | | | | | | | | |
| 7 | | | | | | | | |
| 8 | | | | | | | | |
| 9 | | | | | | | | |
| 10 | | | | | | | | |

සකස් කළේ :- නම :

අත්සන :

දිනය :

පරීක්ෂා කළේ :- නම :

අත්සන :

දිනය :

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-07-04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඉහත තොරතුරු නිවැරදි බවට නිර්දේශ කරමි.

.........................................................................

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
( නිල මුද්‍රාව)

පස්වන පරිශිෂ්ඨය

( පරිපාටියේ 11.3 හා බැදේ.)

ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි (PL1 -2016 ) කම්කරු තනතුර සඳහා වන වාර්ෂික ස්ථාන මාරු කිරීම සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනය

1. නිලධාරියා පිළිබඳ විස්තර
   1.1 සම්පූර්ණ නම :- ……………………………………………………………………
   1.2 අයත් සේවය :- ……………………………………………………………………
   1.3 තනතුර :- ……………………………………………………………………
   1.4 සේවා ස්ථානය :- ……………………………………………………………………
   1.5 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය :- ……………………………………
2. අභියාචනයට පදනම්ව ඇති තීරණය / නියෝගය පිළිබඳ විස්තර
   2.1 තීරණය / නියෝගය කුමක්ද ? යන වග සැකෙවින්
   ……………………………………………………………………
   ……………………………………………………………………
   ……………………………………………………………………
   2.2 තීරණය / නියෝගය නිලධරයාට ලැබුණු දිනය ? ……………………………
   2.3 තීරණය / නියෝගය දුක්වෙන ලිපිවල සහතික කළ පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.
   ඇමුණුම 1 ……………………………………………………
   ඇමුණුම 2 ……………………………………………………
   2.4 අදාළ වෙනත් කරුණු ……………………………………………
   ……………………………………………………………………
3. තීරණයට / නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු
   3.1 ……………………………………………………………………
   3.2 ……………………………………………………………………
   3.3 ……………………………………………………………………
   3.4 ……………………………………………………………………
   3.5 ……………………………………………………………………
   3.5 මෙම හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධක වල සහතික කල පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.
   ඇමුණුම 1 ……………………………………………………
   ඇමුණුම 2 ……………………………………………………
   ඇමුණුම 3 ……………………………………………………
4. ඉල්ලා සිටිනු ලබන සහන :-
   ……………………………………………………………………
   ……………………………………………………………………
   ……………………………………………………………………

දිනය ……………………………………

අත්සන ……………………………

නම ……………………………

තනතුර ……………………………

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

හයවන පරිශිෂ්ඨය

## ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයෙහි (PL1 -2016) දෙපාර්තමේන්තු කම්කරු තනතුරු සංඛ්‍යාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා ස්ථානය අනුව ස්ථාන ගත කළ හැකි ප්‍රමාණය

| අනු අංකය | දිස්ත්‍රික්කය / පළාත | කාර්යාලය | නිලධාරින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | මධ්‍යම පළාත | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 03 |
| 02. | මහනුවර | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 02 |
| 03 | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - කුණ්ඩසාලේ කලාපය | 01 |
| 04. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය -මහනුවර කලාපය | 01 |
| 05. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - උඩුනුවර - යටිනුවර කලාපය | 01 |
| 06. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - හාරිස්පත්තුව කලාපය | 01 |
| 07. | | දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපල - නවයාලතැන්න | 08 |
| 08. | | කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය - පල්ලේකැලේ | 07 |
| 09. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මොරයාය | 01 |
| 10. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - දඹගහපිටිය | 01 |
| 11. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කළුන්තැන්න | 01 |
| 12. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මැදමහනුවර | 01 |
| 13. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - තෙල්දෙණිය | 01 |
| 14. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - නමදගල | 01 |
| 15. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මැණික්හින්න | 01 |
| 16. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - බෝවල | 01 |
| 17. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - වත්තේගම | 01 |
| 18. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - තලාතුඔය | 01 |
| 19. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මාරස්සන | 01 |
| 20. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ඒදඩුවාව | 01 |
| 21. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ඉඹුල්දෙණිය | 01 |
| 22. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගම්පොල | 01 |
| 23. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මැදපිටිය | 01 |
| 24. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කුරුදුවත්ත | 01 |
| 25. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - රඹුක්පිටිය | 01 |
| 26. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - යටිවාවල | 01 |
| 27. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හතරලියද්ද | 01 |
| 28. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - බටුගොඩ | 01 |
| 29. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගලගෙදර | 01 |
| 30. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - අලවතුගොඩ | 01 |
| 31. | මාතලේ | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයය | 02 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| 32: | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - මාතලේ කලාපය | 01 |
| 33. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - දඹුල්ල කලාපය | 01 |
| 34. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - ලග්ගල කලාපය | 01 |
| 35. | | දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපල - නාලන්ද | 17 |
| 36. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - රත්තොට | 01 |
| 37. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - යටවත්ත | 01 |
| 38. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - පලාපත්වල | 01 |
| 39. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - දඹුල්ල | 01 |
| 40. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කිඹිස්ස | 01 |
| 41. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගලේවෙල | 01 |
| 42. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - පල්ලේපොල | 01 |
| 43. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - අළුගොල්ල | 01 |
| 44. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කෝන්ගහවෙල | 01 |
| 45. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ලග්ගල පල්ලේගම | 01 |
| 46. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හෙට්ටිපොල | 01 |
| 47. | නුවරඑළිය | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයය | 03 |
| 48. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - නුවරඑළිය කලාපය | 01 |
| 49. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - කොත්මලේ අඹගමුව කලාපය | 01 |
| 50. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - හඟුරන්කෙත කලාපය | 01 |
| 51. | | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - වලපනේ කලාපය | 01 |
| 52. | | දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපල - ගල්පාලම | 20 |
| 53. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - නුවරඑළිය | 01 |
| 54. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කඳපොල | 01 |
| 55. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ලිඳුල | 01 |
| 56. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හඟුරන්කෙත | 01 |
| 57. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - රිකිල්ලගස්කඩ | 01 |
| 58. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - කරල්ලියද්ද | 01 |
| 59. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මතුරට | 01 |
| 60. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - මන්දාරම්නුවර | 01 |
| 61. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - නිල්දණ්ඩාහින්න | 01 |
| 62. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - තෙරිපැහැ | 01 |
| 63. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - රූපහ | 01 |
| 64. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - රාගල | 01 |
| 65. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හෙල්බොඩ | 01 |
| 66. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - පූඩළුඔය | 01 |
| 67. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - හරංගල | 01 |
| 68. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - විදුලිපුර | 01 |
| 69. | | කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගිණිගත්හේන | 01 |
| | | මුළු නිලධාරීන් සංඛ්‍යාව | 123 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්

2023-09-04 දින

අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

| | | |
|---|---|---|
| 1. පී.ජී.අමරකෝන් මහතා | (සභාපති) | .................................. |
| 2. ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකෝන් මහතා | (සාමාජික) | .................................. |
| 3. ඒ.එම්.වයිස් මහතා | (සාමාජික) | .................................. |
| 4. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | .................................. |
| 5. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා | (සාමාජික) | .................................. |
| 6. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා | (සාමාජික) | .................................. |
| 7. පී.ටී.ජී. ගුණතිලක මහතා | (සාමාජික) | .................................. |

දිනය :..2023. 08. 22..

ආණ්ඩුකාර ලේකම් ,

..2023. 08. 22.. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක ..2023/1494.. යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශිල්පීය නොවන සේවා ගණයෙහි (PL1–2016) දෙපාර්තමේන්තු කම්කරු තනතුර සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටිය" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය : 2023/08/22 ..................................................

ලේකම් ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභා[illegible]
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- අනුමත කරමි. / [illegible]කරමි.

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත

2023 - 09 - 04